# විශේෂ නිවේදනයයි.

**ඊශ්‍රායලයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත,**

**<u>ශ්‍රී ලංකාවට අවශ්‍ය හදිසි වෛද්‍ය උපකරණ ලබා දීම</u>**

ශ්‍රී ලංකාවේ පැතිර යන COVID-19 වසංගත තත්වය පාලනය කිරීමේදී රජයේ රෝහල්හි ධාරිතාවය නැංවීම පිණිස ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳව විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ පරිත්‍යාගශීලීන් විසින් සිදුකරනු ලැබූ විමසීම් පදනම් කරගෙන ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය විසින් පහත සඳහන් වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීමට විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව සහ පරිත්‍යාගශීලීන් හට ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

| | වර්ගය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 | (ICU) Beds | 50 |
| 2 | Oxygen Production Plants /Oxygen Concentrators | 05 |
| 3 | High Flow Oxygen Therapies | 50 |
| 4 | Jumbo Oxygen Cylinders | 1,000 |
| 5 | Pulse Oximeters | 100 |
| 6 | Mini Oxygen Concentrators | 200 |

එසේ ශ්‍රී ලංකාවට අවශ්‍ය වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සහ එම උපකරණ මිළදී ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රදානය කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා සම්බන්ධයෙන් මෑතකදී ඊශ්‍රායලයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් මෙම තානාපති කාර්යාලයෙන් විමසීම් සිදුකර ඇති බැවින් ඒ අනුව ඔබ විසින් ඉහත උපකරණ ලබාදීමට බලාපොරොත්තු වන්නේ නම්, එම උපකරණ ලංකාවට ප්‍රවාහනය කිරීමේදී අවශ්‍ය නම් ඒ සඳහා යන රේගු ගාස්තු නිදහස් කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය වී මෙම තානාපති කාර්යාලය මගින් පහසුකම් සැපයීමට හැකි බව දන්වනු ලැබේ.

එමෙන්ම ඔබ විසින් මුදල් ආධාර ලබාදීමට බලාපොරොත්තු වන්නේ නම්, මුදල් ආධාර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ලබාදීමෙන් හෝ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ජනාධිපති කාර්යාලයට අයත් ගිණුම් අංක 85737373 දරණ 'COVID-19 සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදල' (**COVID-19 Health Care and Social Security Fund**) ගිණුමේ තැන්පත් කළ හැකිය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් තානාපති කාර්යාලයේ පහත සඳහන් නිලධාරි මහතා අමතා ලබාගත හැකිය.

කේ. පී. චන්ද්‍රතිලක මහතා /පරිවාර නිලධාරි - 058 6875764

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්/ඊශ්‍රායලය

2021.05.24